සමාගමේ අංකය : පී.වී. 00206917
ලියාපදිංචි කාර්යාලය : චතු මැදුර, අංක 207/2, පෙළහල, දෙම්පේ
ලියාපදිංචි දිනය : 2018.12.06

සමාගමේ නම : ගොප්රෝ කන්සල්ටන්සි ගෲප් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී.වී. 00206480
ලියාපදිංචි කාර්යාලය : අංක 05, චාල්ස් පෙදෙස, කොළඹ 03
ලියාපදිංචි දිනය : 2018.11.19

සමාගමේ නම : ජයසූරිය කන්ස්ට්‍රක්ෂන් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී.වී. 00206148
ලියාපදිංචි කාර්යාලය : අංක 48, මිල්ලගස්ලන්ද, මග්ගොන, කළුතර
ලියාපදිංචි දිනය : 2018.11.09

සමාගමේ නම : කළම්බු ග්‍රීන් වෙන්චර්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී.වී. 00206314
ලියාපදිංචි කාර්යාලය : අංක 34/2, පේරලන්ද, රාගම
ලියාපදිංචි දිනය : 2018.11.15

සමාගමේ නම : වෙන් සිලෝන් සිනමන් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී.වී. 00206516
ලියාපදිංචි කාර්යාලය : අංක 421/2, මංකඩ පාර, පහළ බියන්විල, කඩවත
ලියාපදිංචි දිනය : 2018.11.21

සමාගමේ නම : ස්පිනකර් ඉන්ටර්නැෂනල් ඊ ඩී යූ (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී.වී. 00206526
ලියාපදිංචි කාර්යාලය : අංක 474/ඩී, ආතර් වී දියෙස් මාවත, පානදුර
ලියාපදිංචි දිනය : 2018.11.21

සමාගමේ නම : අයි බිල්ඩ් කන්ස්ට්‍රක්ෂන් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී.වී. 00206922
ලියාපදිංචි කාර්යාලය : අංක 232, ආරුගම්බේ පාර, පොතුවිල් 02
ලියාපදිංචි දිනය : 2018.12.06

සමාගමේ නම : සෙන්ටර් ෆෝ ටිචිං ඇන්ඩ් ලර්නිං (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී.වී. 00206702
ලියාපදිංචි කාර්යාලය : අංක 37 1/1, කටුගස්තොට පාර, මහනුවර
ලියාපදිංචි දිනය : 2018.11.29

සමාගමේ නම : ද රිලැක්ස් ඔන් හොටෙල්ස් ඉන්ටර්නැෂනල් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය :පී.වී. 00206913
ලියාපදිංචි කාර්යාලය : අංක 6/ඒ/3, මිල්ෆෝඩ් ක්‍රිසන්ට්, දෙහිවල
ලියාපදිංචි දිනය : 2018.12.06

සමාගමේ නම : නේට්‍රියම් ඉන්ස්ටියුට් ඔෆ් සයන්ස් ඇන්ඩ් ටෙක්නොලොජීස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය :පී.වී. 00207122
ලියාපදිංචි කාර්යාලය : අංක 07, ප්‍රධාන වීදිය, අදාලයිච්චායි 05
ලියාපදිංචි දිනය : 2018.12.12

සමාගමේ නම : එස් එම් පී ඉංජිනියරින් ඇන්ඩ් ප්‍රොපර්ටි (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය :පී.වී. 00207227
ලියාපදිංචි කාර්යාලය : අංක 204, වර්ඩ් සිටි ගොඩනැගිල්ල, කුවීන් මේරි පාර, ගම්පහ
ලියාපදිංචි දිනය : 2018.12.17

සමාගමේ නම : වර්ඩ් බිස් ඇග්‍රිකල්චර් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය :පී.වී. 00207495
ලියාපදිංචි කාර්යාලය : අංක 63/1, අරම්පොළ මාවත, මාවතගම, කුරුණෑගල
ලියාපදිංචි දිනය : 2018.12.27

සමාගමේ නම : ඔර්කේ සිලෝන් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය :පී.වී. 00206316
ලියාපදිංචි කාර්යාලය : අංක 388/2, ඇඹුල්ගම පාර, පනාගොඩ, හෝමාගම
ලියාපදිංචි දිනය : 2018.11.15

(ඉහත සඳහන් සමාගම්හි ලේකම්වරු)

02-11

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීමයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ 13, කොටහේන බොන්ජීන් පාර, අංක 57ඒ දරන ස්ථානයේ ලියාපදිංචි දැනට කොළඹ 05, පාක් පාර අංක 215/ඒ/9 හි පිහිටා ඇති ද ගුඩ්විල් මැරයින් ඇකඩමි (පුද්.) සමාගම (ලියාපදිංචි අංක එන් (පී වී එස් 6643) වන අප විසින් අපගේ නීත්‍යානුකුල ඇටර්නි බලකරු ලෙස එම ජනරජයේම මාරවිල මුඩුකටුව ලෙ ෆේවරිටා මාවත හි පදිංචි විජේසිංහ ආරච්චිගේ චන්ද්‍රරත්න හේමකුමාර (ජා. හැ. අංක 620472255 V) යන අය පත්කරමින් සකසන ලද එක්සත් ජනපද සොලිසටර්වරු වන කර්ටිනි ස්මිත් සහ සොලිසිටර් සමාගම විසින් 2008.10.11 වැනි දින ලියා සහතික කරන ලද හා බත්තරමුල්ල රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ලිඛිත බලධාරි සහ ඇටර්නි බලපත්‍ර පොතේ 7 වන කාණ්ඩයේ 109 වන පත් ඉරුවේ 4036 දින පොත් අංක යටතේ 2008.11.30 වැනි දිනැතිව ලියාපදිංචි කරන ලද ඇටර්නි බලපත්‍රය මින් අවලංගු කරන ලද බව ද මින් ඉදිරියට ඉහත කී ඇටර්නි බලකරු කරනු ලබන කවර හෝ ක්‍රියාවකට අප වගකියනු නොලබන බව ද දන්වා සිටිමු.

ද ගුඩ්විල් මැරයින් ඇකඩමි (පුද්.) සමාගම,
ඇටර්නි අධිපති.

02-13/1

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීමයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ 3, ආර් ඒ ද මැල් මාවත, අංක 278-1/2 දරන ස්ථානයේ ලියාපදිංචි දැනට කොළඹ 05, පාක් පාර අංක 215/ඒ/9 හි පිහිටා ඇති ද ගුඩ්විල් (පුද්.) සමාගම (ලියාපදිංචි අංක එන් (පී වී 12142) වන අප විසින් අපගේ නීත්‍යානුකුල ඇටර්නි බලකරු ලෙස එම ජනරජයේ ම මාරවිල මුඩුකටුව ලෙ ෆේවරිටා මාවත හි පදිංචි විජේසිංහ ආරච්චිගේ චන්ද්‍රරත්න හේම කුමාර (ජා. හැ. අංක 620472255 V) යන අය පත් කරමින් සකසන ලද එක්සත් ජනපද සොලිසටර්වරු වන කර්ටිනි ස්මිත් සහ සොලිසටර් සමාගම විසින් 2007.02.01 වැනි දින ලියා සහතික කරන ලද හා කොළඹ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ලිඛිත බලධාරි සහ ඇටර්නි බලපත්‍ර

පොතේ 352 වන කාණ්ඩයේ 133 වන පත් ඉරුවේ 2433 දින පොත් අංක යටතේ 2007.03.01 වැනි දිනැතිව ලියා පදිංචි කරන ලද විදේශ ඇටර්නි බලපත්‍රය මින් අවලංගු කරන ලද බව ද මින් ඉදිරියට ඉහත කී ඇටර්නි බලකරු කරනු ලබන කවර හෝ ක්‍රියාවකට අප වගකියනු නොලබන බව ද දන්වා සිටිමු.

ද ගුඩ්විල් (පුද්.) සමාගම,
ඇටර්නි අධිපති.

02-13/2

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : කොරෝනා ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි ලිපිනය : අංක 142, උඩුවරාගොඩ, කහව
සංස්ථාගත කළ දිනය : 2018 සැප්තැම්බර් මස 22
ලියාපදිංචි අංකය : පීවී 00204539

ලේකම්.

02-14

---

## වර්ෂ 2000.05.19 දිනැති ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

මාතර, කොටුව, වලව්වත්ත, ''සචිනු'' නො. 93 හි පදිංචි සමන් හිරන්ත විජේතුංග වන මා විසින් මාතර ප්‍රසිද්ධ නොතාරිස් එච්. පී. එන්. දයාරත්න විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2000.05.19 දිනැති අංක 2427 දරන ඇටර්නි බලපත්‍රය මගින් මාතර, කොටුව, වලව්වත්ත, ''සචිනු'' නො. 93 හි පදිංචි මිල්ටන් විජේතුංග වෙත පවරන ලද ඇටර්නි බලය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමින් අවලංගු කරන අතර ඔහු විසින් මා වෙනුවෙන් මින් මතු කරනු ලබන කිසිදු ක්‍රියාවක් වෙනුවෙන් මා වගකීමක් නොදරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

සමන් හිරන්ත විජේතුංග,
(661930047 V)

02-19

---

## වර්ෂ 1997.10.09 දිනැති ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීමයි

මාතර, කොටුව, වලව්වත්ත, නො. 93 හි පදිංචි සමන් හිරන්ත විජේතුංග වන මා විසින් මාතර ප්‍රසිද්ධ නොතාරිස් පනංගලගේ ආරියසේන විසින් ලියා සහතික කරන ලද වර්ෂ 1997.10.09 දිනැති අංක 123 දරන ඇටර්නි බලපත්‍රය මගින් මාතර, කොටුව, වලව්වත්ත, නො. 93 හි පදිංචි මිල්ටන් විජේතුංග වෙත පවරන ලද ඇටර්නි බලය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමින් අවලංගු කරන අතර ඔහු විසින් මා වෙනුවෙන් මින් මතු කරනු ලබන කිසිදු ක්‍රියාවක් වෙනුවෙන් මා වගකීමක් නොදරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

සමන් හිරන්ත විජේතුංග,
(661930047 **V**)

02-20

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොළඹ 10, මාලිගාකන්ද පාර, අංක 181/21 දරන ස්ථානයෙහි පදිංචි (ජා. හැ. ප. අංක 731281459 **V**) කෙරවලමුල්ලගේ හේමකුමාර සාගර වන මා විසින්, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පුෂ්ප සී තැග්ගොඩ ආරච්චි මහතා විසින් ලියා සහතික කරන ලද අංක 6882 දරන ඇටෝර්නි බලපත්‍රය අනුව කොළඹ 10, වයිට්පාර්ක් මාලිගාකන්ද පාරේ, අංක 181/21, ස්ථානයෙහි පදිංචි කෙරවලමුල්ලගේ සුනීතා මානෙල් ප්‍රියදර්ශනී (ජා. හැ. ප. අංක 62594229 **V**) යන අයට පවරන ලද ඇටෝර්නි බලපත්‍රය 2019.01.09 දින සිට අවලංගු කර ඇති බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත සහ මහ ජනතාව වෙත මින් දැනුම් දෙනු ලැබේ.

කෙරවලමුල්ලගේ හේමකුමාර සාගර.

02-21

---

## නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම් යථා පරිදි සංස්ථාගත කර ඇති බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ආර් ඇන්ඩ් ටී වෙහිකල් වැලිවේෂන් සෙන්ටර් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පීවී 00201983
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 88/2ඒ, සුනේත්‍රාදේවි පාර, දෙහිවල.
ලියාපදිංචි දිනය : 2018.07.14

02-24

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

බත්තරමුල්ල, පැලවත්ත, ඩී. පී. විජේසිංහ මාවතේ, අංක 704 D/2 දරන ස්ථානයේ පදිංචි වෛද්‍ය බටුවංගල කාරියකරනගේ ශාන්ත සහ එකී ලිපිනයේම පදිංචි වෛද්‍ය පතිරාජ මුදියන්සේලාගේ සාවිත්‍රි වගීශා හේරත් වන අප විසින් අත්සන් කර කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එල්. ඒ. තුෂාරි පලිහවඩන මහත්මිය විසින් වර්ෂ 2012ක්වූ ජනවාරි මස 31 වැනි දින ලියා සහතික කරන ලද අංක 276 දරන ඇටර්නි බලපත්‍රය මගින් ප්‍රියංකරගේ ජීවක ප්‍රසන්න යන අය වෙත දෙන ලද බලය මෙයින් අවලංගු කරන බවත් මින් ඉදිරියට ඔහු විසින් කරනු ලබන කිසිදු කටයුත්තක් සම්බන්ධයෙන් අපගේ වගකීමක් නොමැති බවත් මෙයින් ප්‍රකාශ කරමු.

වෛද්‍ය බටුවංගල කාරියකරනගේ ශාන්ත

වෛද්‍ය පතිරාජ මුදියන්සේලාගේ සාවිත්‍රි වගීශා හේරත්.

01-34

---

## දැන්වීමයි

2007 අංක 7 දරණ සමාගමේ පනතේ 9 (1) වගන්තිය යටතේ කරන දැන්වීමයි

2007 අංක 7 දරන සමාගමේ පනත යටතේ පහත සඳහන් සමාගම 2018 දෙසැම්බර් මස 26 වන දින සංස්ථාපනය කරන ලද බව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

1. සමාගමේ නම : ගෞරි කෙයාර් ක්ලීනිං (ප්‍රයිවට්) ලිමිටඩ්.
   සමාගමේ අංකය : පී වී 00207474
   ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 176, මාලිගාකන්ද පාර, කොළඹ 10.

ලේකම්,
ගෞරි කෙයාර් ක්ලීනිං (ප්‍රයිවට්)
ලිමිටඩ්.
පී වී 00207474

02-42

---

## නිවේදනයයි

මෙල්ස්ටා ගාමා (ප්‍රයිවට්) ලිමිටඩ් 2018 දෙසැම්බර් 9 දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරනු ලැබේ

සමාගමේ නම : ට්‍රැවල්සෙන් සවුත් ඒෂියා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පීවී 00207012
ලියාපදිංචි කාර්යාලය :අංක 308-310, ආර්. ඒ. ද මැල් මාවත, කොළඹ 03, ශ්‍රී ලංකාව.
අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි, කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

ලේකම්වරු,
ට්‍රැවල්සෙන් සවුත් ඒෂියා (ප්‍රයිවට්) ලිමිටඩ්.

02-61

---

## පීසී හවුස් පීඑල්සී
## සමාගමේ ලියාපදිංචි අංකය PV 1827 PB-PQ
## ඇවරකරුවන්ගේ ඉල්ලා අස්වීමේ දැන්වීම

සමාගමේ නම : පීසී හවුස් පීඑල්සී
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 451, ගාලු පාර කොළඹ 03.
උසාවිය : බස්නාහිර පලාතේ වාණිජ මහාධිකරණය (කොළඹ සිවිල්)
නඩු අංකය : HC (සිවිල්) 47/2013/CO
ඇවරකරුවන්ගේ නම : පිංචබදුගේ එක්සිරි අරුණ ජයවික්‍රම සහ ජෙරාඩ් ජීවානන්තන් ඩේවිඩ්
ලිපිනය : 3 වන මහල, අංක 11 කාසල් පටුමග, කොළඹ 04.
ඇවරකරුවන්ගේ ඉල්ලා අස්වීමේ දිනය : 04.01.2019

02-67

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) ඡේදය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.
සමාගමේ නම : අ මිනිට් බයි ටුක් ටුක් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : 00207415
ලියාපදිංචි ලිපිනය : 21 මහල, බටහිර කුලුන, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01

සමාගම් ලේකම්.

02-69

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) ඡේදය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.
සමාගමේ නම : එස්කැපේඩ් ලෙෂර් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී.වී. 00207710
ලියාපදිංචි ලිපිනය : 21 මහල, බටහිර කුලුන, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01.

02-70

**සීමිත වගකීම් සහිත සමාගමක් සංස්ථාපනය කිරීමේ දැන්වීමයි**

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කෙරේ.
සමාගමේ නම : ග්‍රීන්මෝ (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී.වී. 00207641
ලියාපදිංචි කාර්යාලය : අශෝකාරාම පාර, දෙඩම්පහළ, දික්වැල්ල
සංස්ථාපනය කළ දිනය : 2019.01.02

සමාගම් ලේකම්වරු.

02-71

---

**සීමිත වගකීම් සහිත සමාගමක් සංස්ථාපනය කිරීමේ දැන්වීමයි**

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කෙරේ.
සමාගමේ නම : යුනික් ෆුඩ් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී.වී. 00207525
ලියාපදිංචි කාර්යාලය : අංක 178/5, කොළඹ පාර, කෙහෙල්වල, කිරිබත්කුඹුර.
සංස්ථාපනය කළ දිනය : 2018.12.28

සමාගම් ලේකම්වරු.

02-72

---

**ප්‍රසිද්ධ නිවේදනයයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 5 වැනි වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.
සමාගමේ නම : අජන්තා හාඩ්වෙයාර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සංස්ථාපනය කළ දිනය : 2009 දෙසැම්බර් මස 10
සමාගමේ අංකය : පී වී 17201
ලියාපදිංචි ලිපිනය : අංක 420, පරණ යොන් වීදිය, කොළඹ 14.

අධ්‍යක්ෂ.

02-74

---

**මහජනතාව වෙත දැනුම් දීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත පුද්ගලික සමාගම සංස්ථාපනය කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : අවුරා ලෝන්ච් සහ බාර් (පුද්ගලික) සමාගම
ලියාපදිංචි අංකය : පී. වී. 00207934
ලියාපදිංචි දිනය : 2019.01.12
ලියාපදිංචි කාර්යාලය : අංක : 528/2, සපුගස්කන්ද පාර, ගෝනවල, කැළණිය.

සමාගම් ලේකම්.

02-108

---

**2007 අංක 7 දරන සමාගමේ පනත දැන්වීමයි**

විජිනි හෝල්ඩිංස් (පිවිටි) එල්ටිඩි - පි වි 00204676

ඉහත සඳහන් සමාගම 2018 සැප්තැම්බර් මස 26 වැනි දින සංස්ථාගත කළ බව සහ එහි ලියාපදිංචි කාර්යාලය අංක 29/97ඒ, ශ්‍රී සරණංකර පාර, කළුබෝවිල, දෙහිවල යන ලිපිනයේ පවත්වාගෙන යන බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ මින් දැනුම් දෙමු.

කේ. ජී. ඒ. එස්. සිල්වා මහතා,
අධ්‍යක්ෂක.

02-109

---

**නිවේදනයයි**

2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

සමාගමේ නාමය : ටීස්පයර් සිලෝන් ( පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : PV00207078
ලියාපදිංචි කළ දිනය : 2018.12.10
ලියාපදිංචි ලිපිනය : අංක 47, පරත්ත පාර, කෙසෙල්වත්ත, පානදුර.

සමාගම් ලේකම්.

02-127

---

**ඇටෝර්නි බලය අවලංගු කිරීමයි**

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ, ගලගෙදර, කවුඩුල්ල, මල්වතුගොඩ, අංක 125/1 හි පදිංචි රත්නායක මුදියන්සේලාගේ ඉන්ද්‍රානි විජේන්ද්‍ර මැණිකේ (ජා.හැ.අංක 586350838 වී) වන මා

ප්‍රසිද්ධ නොතාරිස් එම්.ආර්.කේ. බණ්ඩාර මහතා විසින් වර්ෂ 2016 ක් වූ පෙබරවාරි මස 29 වන දින ලියා සහතික කළ අංක 169 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් මල්වතුගොඩ ගලගෙදර හි පදිංචි විජේසිංහ මුදියන්සේලාගේ අනුර බණ්ඩාර විජේසිංහ (ජා. හැ. අංක 592941210 වී) යන අය වෙත පවරන ලද එකී ඇටෝර්නි බලය වර්ෂ 2019 ජනවාරි මස 18 අද දින සිට මෙයින් අවලංගු කරන බව ශ්‍රී ලංකාවාසී සියලු දෙනාටම මෙයින් දැනුම් දෙමි.

රත්නායක මුදියන්සේලාගේ ඉන්ද්‍රානි විජේන්ද්‍ර මැණිකේ.

02-128

---

## දැන්වීමයි

2017 අංක 7 දරන සමාගම් පනත ප්‍රකාරව 2013.02.15 දින සිට ලියාපදිංචි කර ඇති ප්‍රතාප් චාර්ටඩ් වැලුවේෂන් සර්වේයර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් නමැති සමාගමේ නාමය 2013.10.10 දින සිට ප්‍රතාප් චාර්ටඩ් වැලුවේෂන් ඇන්ඩ් කන්සල්ටන්සි (ප්‍රයිවට්) ලිමිටඩ් වශයෙන් වෙනස් කරන ලද බව දන්වා සිටිමි.

සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 91082

ලියාපදිංචි කාර්යාලය : නො.6C, ක්ලියර් පොයින්ට් රෙසිඩෙන්සීස්, පෙරේරා මාවත, කොටුවෙගොඩ, රාජගිරිය.

සමාගම් ලේකම්.

02-135

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

මඩකලපුව, මුහන්දිරම් පාර, අංක 19/3 පදිංචිව සිටි දැනට අංක 23, ඔක්ස්ලි අවනිව්, වුල්පොයින්ට් ඕ එල් ඩී 4019,ඕස්ට්‍රේලියාව (No. 23, Oxley Avenue, Wooly Point OLD 4019, Australia) හි පදිංචි සුභකහදේවි දිනේෂ් හන්ස්රාජ් වන මා විසින් මඩකලපුව, මුහන්දිරම් පාර, අංක 19/3 පදිංචි සාන්තජීවා සෞන්දරි මුරුගප්පන් ( ජා. හැ. අංක 347751596 V) යන මාගේ මවට ඕස්ට්‍රේලියාවේ ප්‍රසිද්ධ නොතාරිස් ජිම් කිල්ඩන් ඉදිරිපිට වර්ෂ 2013 ක් වූ ජනවාරි මස 30 වන දින ලියා සහතික කරන ලද ඉහත දරන ඇටෝර්නි බලපත්‍රය කොළඹ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ දිනපොත් අංක 161 යටතේ 74/21 පොතේ ලියාපදිංචි කර ඇති ඉහත දින දරන ඇටෝර්නි බලපත්‍රය මා විසින් වර්ෂ 2018 ක් වූ දෙසැම්බර් මස 17 වැනි දින සිට අවලංගු කරන අතර, එම ඇටෝර්නි බලපත්‍රය අවලංගු කර ශුන්‍යයකර ඇති බව ද මේ ශ්‍රී ලංකා ජනරජයේ ශ්‍රී ලංකා වාසි සියලු මහජනතාවට මෙයින් දැනුම් දෙමින් මෙය ප්‍රසිද්ධ කරමු. මෙම වර්ෂ 2018 ක් වූ දෙසැම්බර් මස 17 වන අද දිනෙන් පසු එකී ඇටෝර්නි බලපත්‍රය මගින් ඉහත කී මඩකලපුව, මුහන්දිරම් පාර, අංක 19/3 පදිංචි සාන්තජීවා සෞන්දරි මුරුගප්පන් (ජා. හැ. අංක. 347751596 V) යන අය කරන සියලු ගනුදෙනුවලට අප කිසිවිටක වගකීම් බාර නොගන්නා බවත් මෙයින් දැනුම් දී ප්‍රකාශ කර සිටිමු.

වර්ෂ 2018 ක් වූ දෙසැම්බර් මස 17 වන දින දීය.

සුභකහදේවි දිනේෂ් හන්ස්රාජ්.

02-155

---

## දැනුම්දීමයි

සීමාසහිත දොලේකන්ද පවර් (පීවීටී) එල්ටීඩී (ලියාපදිංචි අංකය : PV 70023) හි ණය හිමියන් විසින් එම සමාගම ස්වේච්ඡාවෙන් ඈවර කිරීමේ රැස්වීම සම්බන්ධව දැනුම්දීමයි.

ඉහත සඳහන් සමාගමේ ණය හිමියන් විසින් පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් රැස්වීමක් වර්ෂ 2019 ක් වූ පෙබරවාරි මස 15 වන දින කොළඹ 08, ඩඩ්ලි සේනානායක මාවත, අංක 19 දරන ස්ථානයේදී පෙ.ව. 10.30 ට පවත්වනු ලබන බව 2007 අංක 7 දරන සමාගම් ආඥපනතේ 334 (2) වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

(1) සමාගමේ කටයුතු (Statement of Affairs) සමාලෝචනය කිරීම.

(2) සමාගමේ ණයහිමියන් විසින් සමාගම ස්වේච්ඡාවෙන් ඈවර කිරීම අනුමත කිරීමට/සලකා බැලීමට

(3) 2007 අංක 7 දරන සමාගම් ආඥපනතේ අංක 335 වගන්තිය යටතේ ඈවරකරුවෙකු පත් කිරීම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
සීමාසහිත දොලේකන්ද පවර් (පීවීටී) එල්ටීඩී.

එල්.ඕ.එල්.සි. කෝපරේට් සර්විසස් පුද්ගලික සමාගම.
සමාගම් ලේකම්වරු.

2019 ක්වූ ජනවාරි මස 18 වන දින දී ය.

02-159

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

කඩවත, ඉහළ කරගහමුණ සිම්පෝනියාවත්ත, අංක 10/2/ඊ1, යන ස්ථානයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංකය 194984710087 හිමි පැලකැටිය සීතා පද්මිණී කලමුල්ල වඩුගේ හෙවත්, සීතා පද්මිණී

පැලකැටිය (විවාහයට පසු කලමුල්ල) වන මම කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සිරිනන්ද ගුණවර්ධන මහතා විසින් වර්ෂ 2017.03.19 වැනි දින ලියා සහතික කරන ලද අංක 955 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් පන්නිපිටිය, හෝකන්දර පාර, අංක 1466/1 දරන ස්ථානයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 543412090V හිමි හෙට්ටිආරච්චිගේ විජේරත්න පෙරේරා යන අයට ලබා දුන් ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බවටත්, ඇටෝර්නි බලපත්‍රයේ සඳහන් ඇටෝර්නි බලකරු විසින් මෙදිනෙන් පසු මා වෙනුවෙන් කරනු ලබන ක්‍රියාවන් හෝ ගණුදෙනු සම්බන්ධයෙන් මා විසින් කිසිදු වගකීමක් භාර ගනු නොලබන බව ද ශ්‍රී ලංකා ජනරජයටත්, සහ මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

පැලකැටිය සීතා පද්මිණි කලමුල්ල වඩුගේ.

02-168

**දැන්වීමයි**

මුහන්දිරම්ගේ සුනිල් රම්‍යසිරි කොස්වත්ත (ජ. හැ. අංකය 550630400X) වන මා විසින් ප්‍රසිද්ධ නොතාරිස් ඒ. වී. අබේනායක විසින් ලියා සහතික කළ අංක 1578 හා 2016.08.08 දාතම දරන නුගේගොඩ, දෙල්කඳ, බස්නාහිර පළාතේ, රෙජිස්ට්‍රාර් ජනරාල් උපකාර්යාලයේ, ඇටෝර්නි බලපත්‍ර ලියාපදිංචි ලේඛනයේ වෙළුම/පත් ඉරුව 186/27 හි ලියාපදිංචි කර ඇති ඇටෝර්නි බලපත්‍රය මගින් අතපත්තු මුදියාන්සේලාගේ ගයාන් ප්‍රදීප් අතපත්තු (ජා. හැ. අංකය 840351823V) වෙත මාගේ නෛතික ඇටෝර්නි බලකරු වශයෙන් ක්‍රියා කිරීමට පවරන ලද ඇටෝර්නි බලය අද දින සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රත්‍යාදිෂ්ඨකොට අවලංගු කළ බැවි සියලු දෙනාට දැනුම් දෙනු ලැබේ.

මුහන්දිරම්ගේ සුනිල් රම්‍යසිරි කොස්වත්ත.

02-469

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - කළුතර ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ පනතේ 4 වැනි වගන්තිය යටතේ
විකුණුම් දැන්වීම
වෙන්දේසියේ විකිණීම

පානදුර ප්‍රසිද්ධ නොතාරිස් පී. වී. එන්. ඩබ්. පෙරේරා විසින් සහතික කරන ලද්දා වූද, හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී නමට ලියන ලද්දා වූද, 2010.04.22 වැනි දින සහතික කළ අංක 3026, 2011.07.05 වැනි දින සහතික කළ 3510, කළුතර ප්‍රසිද්ධ නොතාරිස් වයි. එන්. පී. ද සිල්වා විසින් 2013.07.05 වන දින සහතික කළ අංක 825, 2013.12.16 වැනි දින සහතික කළ අංක 957, 2014.01.23 වැනි දින සහතික කළ අංක 980 සහ 2017.11.30 වැනි දින සහතික කළ අංක 2161 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ඉලංගගේ සුදේශ් ක්‍රිෂාන්ත පෙරේරා යන අය ණයකරුවන් ලෙස මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කරය යටතේ අයවිය යුතු ණය මුදල්, සියලු ගෙවීම් හා වෙන්දේසි ගාස්තු ඇතුළු සියලුම වියදම් මුදල් අයකර ගැනීම සඳහා, මෙහි පහත සඳහන් දේපල.

හැටන් නැෂනල් බැංකුව පී.එල්.සී වෙතින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2019 පෙබරවාරි 25 වැනි දින ප.ව. 2.30 දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ කළුතර තොටමුනේ උතුර කළුතර බැද්ද හි කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කළුතර ප්‍රාදේශීය සභා සීමාව තුළ වස්කඩුව උපකාර්යාලයේ එතනමඩල 718 ග්‍රාම නිලධාරි වසමේ ජාවත්ත හි පිහිටි මොරගහකන්ද නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. කේ. මහින්ද විසින් 2006 අගෝස්තු මස 24 වැනි දින මැන සාදන ලද අංක 2856 දරන ඉඩම ප්‍රමාණයෙන් පර්චස් විසි දෙකයි දශම නමයයි බිංදුව (අ.0, රූ.0, ප.22.90) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ඇතුළුව සියලු දේද වේ.

*වැඩි විස්තර සඳහා.-* 2018.10.12 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද, 2018.12.07 වැනි දින මව්බිම සහ 2018.10.22 වැනි දින ලක්බිම, ඩේලිමිරර් සහ තිනක්කුරල් පුවත්පත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසෙන මාර්ගය.-* කළුතර නගරයේ සිට කොළඹ මාර්ගය දිගේ කි. මී. 02ක් පමණ "නාගස් හන්දිය" දක්වා යන්න. ඉන්පසු හොරණ මාර්ගය දෙසට දකුණට හැරෙන්න මීටර් 400ක් පමණ යන්න, ජාවත්ත පාරට දකුණට හැරෙන්න. ඉන්පසු කි.මී. 1ක් පමණ ගොස් බුද්ධ ප්‍රතිමාව ස්ථානයෙන් ගුරු පාර දෙසට වමට හැරෙන්න. මෙය සන්හිඳ පුරවර හරහා යයි. ඉන්පසු මීටර් 60ක් පමණ පළමුවෙනි මාර්ග හතරේ හන්දිය දක්වා ගමන් කරන්න. නවීන තට්ටු නිවසක් වූ අදාළ දේපල වම් අත පැත්තේ පිහිටා ඇත. අවසාන ප්‍රවේශය වාහනයකින් යාමට හැකි ය.

*ගෙවීමේ ක්‍රමය.-*

1. ගැනුම් මිලෙන් 10%ක් ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක්ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1,000 ක්ද,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
6. විකුණුම් සහතිකය හා මුද්දර ගාස්තු ද,

ගැනුම් මිලෙන් 90% ක් වූ මුදල විකුණුම් දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැංකුව පී.එල්.සී වෙත ගෙවා නිම කළ යුතුයි. ප්‍රධාන කළමණාකරු (අයකිරීම්) හැටන් නැෂනල් බැංකුව පී.එල්.සී අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10 ලිපිනය වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක : 011-2661866, 011-2661828

හිමිකම් ඔප්පුව සහ වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබා ගත හැක.

ඉහත සඳහන් කරන ලද මුදල් දින තිහක් (30) ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මුදලෙන් 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතියක් ඇත.

ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතු ය.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු, සාම විනිසුරු (මුළු දිවයිනටම)

නො. 11/55, බෝගහවත්ත,
කුඩාබුත්ගමුව, අංගොඩ.
දුරකථන : 011 2053286/ 072 3207533
076 9217329/ 072 0881044

02-90

---

## හැටන් නැෂනල් බැංක් පීඑල්සී - කළුතර ශාඛාව

1990 අංක 04 දරන පනත මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ පනතේ
4 වැනි වගන්තිය යටතේ විකුණුම් දැන්වීම
වෙන්දේසියේ විකිණීම

පානදුර ප්‍රසිද්ධ නොතාරිස් ජී. වී. එන්. ඩබ්. පෙරේරා විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂන්ල් බැන්ක් පී.එල්.සී නමට ලියන ලද්දා වූ ද 2014.09.24 වැනි දින සහතික කළ අංක 4648 සහ 2014.12.22 වැනි දින සහතික කළ 4738, කළුතර ප්‍රසිද්ධ නොතාරිස් වයි. එන්. පී. ද සිල්වා විසින් 2015.07.30 වන දින සහතික කළ අංක 1364 සහ 2016.12.09 වැනි දින සහතික කළ අංක 1534 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ඉලංගගේ සුදේශ් ක්‍රිෂාන්ත පෙරේරා යන අය ණයකරුවන් ලෙස මුදල් ගෙවීම පැහැර ඇති හෙයින්, එකී බැඳුම්කරය යටතේ අයවිය යුතු ණය මුදල්, සියලු ගෙවීම් හා වෙන්දේසි ගාස්තු ඇතුළු සියලුම වියදම් මුදල් අයකර ගැනීම සඳහා, මෙහි පහත සඳහන් දේපල.

හැටන් නැෂනල් බැංකුව පී.එල්.සී වෙතින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2019 පෙබරවාරි 25 වැනි දින පෙ.ව. 10.30 දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ කළුතර තොටමුනේ උතුර කළුතර බැද්ද හි දොඩංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ කොහොලාන උතුර 719බී ග්‍රාම නිලධාරි වසමේ කොහොලාන හි පිහිටි නැවත මැන එකාබද්ධ කරන ලද ලොට් ඒ, බී, සී, සහ ඩී උස්ගහවත්ත හෙවත් කන්කානන්ගේවත්ත නමැති ඉඩම බලයලත් මිනින්දෝරු එම්. වී. ටී. පී. ජයසුන්දර විසින් 2011 අප්‍රේල් මස 19 වැනි දින මැන සාදන ලද අංක 11/62 දරන ඉඩම ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දහසයයි දශම හයක් (අ.0, රූ.1, ප.16.6) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ඇතළුව සියලු දේද වේ.

*වැඩි විස්තර සඳහා.-* 2018.10.12 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* ද, 2018.12.07 වැනි දින මව්බිම සහ 2018.10.22 වැනි දින ලක්බිම, ඩේලිමිරර් සහ තිනක්කුරල් පුවත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීමේ මාර්ගය.-* කළුතර නගර මධ්‍යයේ (ඔරලෝසු කනුව) සිට මාර්ග තුනේ හන්දිය (පලාතොට හන්දිය) දක්වා කළුතර පලාතොට මාර්ගය දිගේ කි. මී. 1.4ක් පමණ යන්න. ඉන්පසු සේරුපිට-පන්විල ප්‍රසිද්ධ ප්‍රවාහන පාරට වමට හැරෙන්න. කි. මී. 4ක් පමණ යන්න. (පාලම ළඟ සිට මීටර් 300) අඩි 10 සිට අඩි 12 දක්වා පළල් වාහන යන ප්‍රසිද්ධ මාර්ගයන්වන හාලමුල්ල පාරට වමට හැරෙන්න. (සමූපකාර ගොඩනැගිල්ල ඉදිරිපිට) මීටර් 250ක් පමණ යන්න. අදාළ දේපළ දකුණු අත පැත්තට මුහුණලා ඇත. (ජමීලා නිවස)

*ගෙවීමේ ක්‍රමය.-*

1. ගැනුම් මිලෙන් 10%ක් ද,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක් ද,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1,000 ක්ද,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
6. විකුණුම් සහතිකය හා මුද්දර ගාස්තු ද,

ගැනුම් මිලෙන් 90% ක් වූ මුදල විකුණුම් දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැංකුව පී.එල්.සී වෙත ගෙවා නිම කළ යුතුයි. ප්‍රධාන කළමණාකරු (අයකිරීම්) හැටන් නැෂනල් බැංකුව පී.එල්.සී අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10 ලිපිනය වෙත ගෙවිය යුතු ය.

දුරකථන අංක : 011-2661866, 011-2661828

හිමිකම් ඔප්පුව සහ වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබා ගත හැක.

ඉහත සඳහන් කරන ලද මුදල් දින තිහක් (30) ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මුදලෙන් 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතියක් ඇත.

ඉහත වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුය.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු, සාම විනිසුරු (මුළු දිවයිනටම)

නො. 11/55, බෝගහවත්ත,
කුඩාබුත්ගමුව, අංගොඩ.
දුරකථන : 011 2053286/ 072 3207533
076 9217329/ 072 0881044

02-91

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - බොරලැස්ගමුව ශාඛාව (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. ඩී. ඒ. කේ. අධිකාරී විසින් සහතික කරන ලද්දා වූ ද, හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි නමට ලියන ලද්දා වූ ද, 2016 ජනවාරි මස 28 වැනි දින සහතික කළ අංක 2588, 2016 ජනවාරි මස 28 වැනි දින සහතික කළ අංක 2589 සහ 2016 ජනවාරි මස 28 වැනි දින සහතික කළ අංක 2590 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම නිමල් අබේවර්ධන ඩිස්ට්‍රිබියුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු ලෙස සහ රෝයල් ඩිස්ට්‍රිබියුටර්ස් සහ ඒජන්සිස් (ප්‍රයිවට්) ලිමිටඩ් උකස්කරු ලෙස පැහැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල්, සියළු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියළුම මුදල් අය කර ගැනීම පිණිස පහත සඳහන් දේපළ වර්ෂ 2019ක් වූ පෙබරවාරි මස 22 වැනි දින පෙ. ව. 11.30ට මා විසින් එම දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළ :-

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නුගේගොඩ, 519 ග්‍රාම නිලධාරී වසමේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව තුළ පාගොඩ හි පිහිටි ස්ටැන්ලි තිලකරත්න මාවතේ වරිපනම් අංක 187 සහ 189 දරන තලගහඔිවිට හෙවත් ඇලබොඩඔිවිට කජුගහඔිවිට නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ජයසූරිය විසින් 2002 පෙබරවාරි මස 19 වැනි දින පිළියෙල කරන ලද අංක 1878 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දැක්වෙන පර්චස් දහයයි දශම හයයි බිංදුව (අ.0, රූ.0, පර්.10.60) ක විශාලත්වයෙන් වූ ඉඩම සමඟ වන මෙය දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කාර්යාලයෙ වෙළුම/ පත් ඉරු ඒ 249/15 යටතේ ලියාපදිංචි වී ඇත.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2018.03.16 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* හා 2018.04.03 දිනැති ලක්බිම, ඩේලිමිරර් සහ තිනක්කුරල් පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම.* - කොළඹ නගරයේ සිට පැමිණෙන විට නුගේගොඩ සුපිරි වෙළඳ සංකීර්ණය හන්දියෙන් ස්ටැන්ලි තිලකරත්න මාවතේ මීටර් 150ක් පමණ ඉදිරියට පැමිණෙන විට එහි වම් පසට වන්නට බ්‍රිටිස් වේ ඉංග්ලිෂ් ඇකඩමි ආයතනයට ඉතා ආසන්නයේ එය ඉදිරිපිට පාරේ විරුද්ධ දෙසින් පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

01. ගැණුම් මුදලින් සියයට දහයක් (10%) ක් ද,
02. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ක් ද.
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5)ක් ද,
04. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහසක් (රු.2,000) ක් ද,
05. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සිය (රු.500) ක් ද,
06. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා අදාළ ලේඛන පරීක්ෂා කිරීමට සහ වැඩි විස්තර සඳහා ජ්‍යේෂ්ඨ කළමණාකරු, ණය අධීක්ෂණය සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.
අමතන්න. දුරකථන - 011-2664664

ජේ. ඩබ්ලිව්. ඊ. ජයවර්ධන,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා බලයලත් වෙන්දේසිකරු.

අංක 59, කුමාර මාවත, පටුවත, දොඩන්දූව,
දුරකථන අංක - 091-2277105, 0779663420
ඊ-මේල් :- ejayawardhana77@gmail.com

02-92/1

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී - බොරලැස්ගමුව ශාඛාව (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. ඩී. ඒ. කේ. අධිකාරි විසින් සහතික කරන ලද්දා වූ ද, හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී හි නමට ලියන ලද්දා වූ ද, 2016 ජනවාරි මස 28 වැනි දින සහතික කළ අංක 2585 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම නිමල් අබේවර්ධන ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල්, සියළු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියළුම මුදල් අය කර ගැනීම පිණිස පහත සඳහන් දේපළ වර්ෂ 2019ක් වූ පෙබරවාරි මස 26 වැනි දින පෙ. ව. 11.30ට මා විසින් එම දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළ :-

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, දකුණු ගිරුවා පත්තුවේ, තංගල්ල නගර සභා සීමාව තුළ තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොටුවේගොඩ ග්‍රාම නිලධාරි වසමේ කොටුවේගොඩ කොට්ඨාස අංක 1 පරාක්‍රමහි පිහිටි ජයසූරියවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. සිරිබද්දනගේ විසින් 2011 පෙබරවාරි 02 වැනි දින පිළියෙල කරන ලද අංක 4611 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් "ඒ" වශයෙන් දැක්වෙන එකී අංක 464 දරන පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් එකයි දශම නවය (අ.0, රූ.1, පර්.1.9) ක විශාලත්වයෙන් යුතු වූ ඉඩම සමඟ වන තංගල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ පත් ඉරු ජී 46/108 යටතේ ලියාපදිංචි වී ඇත.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2018.03.16 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* හා 2018.04.03 දිනැති ලක්බිම, ඩේලිමිරර් සහ තිනක්කුරල් පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම.* - තංගල්ල නගරයේ සිට පරාක්‍රම පාරේ (හැටන් නැෂනල් බැංකු කාර්යාලය සහ පොදු වෙළෙඳ පොල ඉදිරිපිට) මීටර් 200ක් පමණ ගමන් කළ පසු දකුණු අත පැත්තේ වංගුව අසල දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

01. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
02. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%) ක් ද.
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
04. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහසක් (රු.2,000) ක් ද,
05. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පනසියය (රු.500) ක් ද,
06. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා අදාල ලේඛන පරීක්ෂා කිරීමට සහ වැඩි විස්තර සඳහා ජ්‍යෝෂ්ඨ කළමණාකරු, (ණය අධීක්ෂණය සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී., අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

අමතන්න. දුරකථන - 011-2661826, 2661835

ජේ. ඩබ්ලිව්. ඊ. ජයවර්ධන,
(මුළු දිවයිනටම සාම විනිසුරු)
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා බලයලත් වෙන්දේසිකරු.

අංක 59, කුමාර මාවත, පටුවත, දොඩන්දූව,
දුරකථන අංක - 091-2277105, 0779663420
ඊ-මේල් :- ejayawardhana77@gmail.com

02-92/2

---

## ඩීෆ්සීසී බැන්ක් පී. එල්. සී. මගින්

අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ

### ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමක්

ඉතා වටිනා පදිංචියට සුදුසු දේපළක් අම්පාර දිස්ත්‍රික්කයේ, අම්පාර නගර සභා සීමාව තුළ ජයවර්ධනපුර ග්‍රාමනිලධාරි වසම **B** කලාපයේ පිහිටි ඉඩමට බලයලත් මානක කේ. ජී. අමරදේව විසින් 2010/02/10 වැනි දින සාදන ලද අංක 15/2010 දරන පිඹුරේ නිරූපිත ලොට් **A** නැමති ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාව ඇතුළු අනෙකුත් සියළු දේ ඉඩමේ ප්‍රමාණය පර්චස් 21.7

ඉහත කී පිඹුරේ සඳහන් පාරවල් උඩින් යටින් හා ඔස්සේ පාවිච්චි කිරීමේ සම්පූර්ණ අයිතියද සමගින්

*දේපළට පිවිසීම* - අම්පාර නගර මධ්‍යයේ සිට ඩී එස් සේනානායක වීදිය ඔස්සේ කිමී. 0.5ක් පමණ බුද්දන්ගල හන්දිය දක්වා පැමිණ වමට හැරී බුද්දන්ගල පාරට පිවිස එම පාරේ

කිමී. 1-1/4ක් පමණ ජයවර්ධනපුර නිවාස යෝජනා ක්‍රමය දක්වා පැමිණි විට බුද්දන්ගල පාරට මායිම්ව පාරේ වම් පසින් අදාළ දේපළ පිහිටා තිබේ.

මෙම දේපළ අම්පාර පදිංචි කුරුඹුලේ ගමගේ ඉන්දුල ගමගේ යන අය බන්ධනදායි වශයෙන් ඩීඑෆ්සීසී බැන්ක් පී. එල්. සී. නමින් ප්‍රසිද්ධ නොතාරිස් ශෂික එන් එස් ද සිල්වා ලියා සහතික කරන ලද අංක 785 සහ 813 දරන උකස් බැඳුම්කරයන් මගින් ඩීඑෆ්සීසී බැංකුවට උකස් කර ඇත.

2019 ක් වූ මාර්තු මස 05 වැනි දින පෙ. ව. 10.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2018.10.19 දින රජයේ *ගැසට් පත්‍රය* ද, 2018.10.09 දින දිවයින, දි අයිලන්ඩ් හා 2018.10.11 වැනි දින තිනක්කුරල් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය* : මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය :-

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,000.00,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.00,

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : කළමනාකරු නීති අංශය, ඩීඑෆ්සීසී බැන්ක් පී. එල්. සී., අංක 73, ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 02.

දුරකථන අංක : 011-2 371 371

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක : 081-2210595/ 071-8446374/071-4962449

02-120

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් පී.එල්.සී. මගින්**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ
ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමක්

මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා මහනුවර නගර සභා සීමාව තුළ අංක 250, පිටකන්දගම ග්‍රාම නිලධාරී වසමෙහි පල්ලේ මහයියාව ගමේ පිහිටි නුගදන්ඩාවේ හේන කියනු ලබන ඉඩමට බලයලත් මානක සුසිරි ඒකනායක විසින් 2007.06.23 වැනි දින සාදන ලද අංක 3523 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 01 දරන බෙදා වෙන් කළ ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාව ඇතුළු අනෙකුත් සියලු දේ. ඉඩමේ ප්‍රමාණය : පර්චස් 12

මෙම දේපළ ජෙයිනුල් ආබදීන් ෆුවාඩ් මරික්කාර් සහ ෆුවාඩ් මරික්කාර් මොහොමඩ් ෆෙරෝස් යන අය බන්ධනදායින් වශයෙන් හා ජෙයිනුල් ආබදීන් ෆුවාඩ් මරික්කාර් උකස්කරු වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම*- මහනුවර නගරයේ සිට කටුගස්තොට පාරේ කිමී. 2.50ක් පමණ මහයියාව දක්වා (සෙන්ට්‍රල් ෆිනෑන්ස් වාහන අංගනය දක්වා) ගමන් ගෙන වමට හැරී එම පාරේ මීටර් 60ක් පමණ ගත් පසු අදාළ දේපළ පිහිටා තිබේ.

2019 ක් වූ මාර්තු මස 01 වැනි දින පෙ.ව. 10.30ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුති සඳහා 2018.10.19 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* ද , 2018.10.16 වැනි දින දිවයින, අයිලන්ඩ් සහ තිනක්කුරල් පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය* : මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,000.00,

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : කළමනාකරු කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් පී. එල්. සී., අංක 172, මඩවල පාර, කටුගස්තොට.

දුරකථන අංක : 081-2497910, 081-2499836, 081-2498341

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක : 081-2210595/ 071-8446374/071-4962449

02-121

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - එරාවූර් ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ

**ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමක්.**

මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරාවූර් ගමේ එරාවූර් පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය එරාවූර් පත්තු ප්‍රාදේශීය සභා සීමාවන් තුළ මිරකර්නි ග්‍රාම නිලධාරි වසම තුළ මිරකර්නි ගමේ මිරකර්නි පාරේ පිහිටි ඉඩමට බලයලත් මානක ඒ. එම්. නවුජුඩීන් විසින් 2017.02.11 වැනි දින සාදන ලද අංක ඒ. එම්. එන් 17/ඊපී/7499 දරන පිඹුරේ නිරූපිත ලොට් 01 නමැති බෙදා වෙන් කළ ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාව ඇතුළු අනෙකුත් සියලු දේ. ඉඩමේ ප්‍රමාණය රූඩ්. 01, පර්චස් 30.85 සහ එහි සියලුම සවි කරන ලද නිශ්චල යන්ත්‍රෝපකරණ යන්ත්‍ර සූත්‍ර සහ මෙවලම් ඇතුළු පහත විස්තර කර ඇති නිශ්චල දේපළ ද සමගින් වේ.

| විස්තරය | වර්ගය හා මාදිලිය | ආරම්භක රට |
|---|---|---|
| නිව් රයිස් කලර් සෝර්ටින් මැෂින් (යුනිට් 01) | 6R හයි ස්පීඩ් රියල් යටිම් අයිඩෙන්ටිෆිකේෂන් සිස්ටම් 6SXM378 | චීනය |
| ටැන්ක් (08) | - | - |
| එළිවේට් (2' 1/2 x26 (06) | - | - |
| කලර් සෝර්ට් කැබින් (01) | - | - |
| මෝටර් 3HP (06) | - | - |
| 1200 C වෙයිබ්‍රිජ් ප්ලැට්ෆෝර්ම් (යුනිට් 01) | - | එක්සත් රාජධානිය |

මෙම දේපළ ඔරයිසා රයිස් එක්ස්පෝටර්ස් (ප්‍රයිවේට්) ලිමිටඩ් යන අය බන්ධනදායී වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම* - එරාවූර් නගරයේ ඔරලෝසු කණුව හන්දියේ සිට පුන්නයිකුඩා පාරේ මීටර් 800ක් පමණ ගමන් ගෙන දකුණට හැරී මිරකර්නි පාරට පිවිස මෙම පාර ඔස්සේ මීටර් 300ක් පමණ ගමන් ගත් පසු මෙම පාරට මායිම්ව වම් පසින් අදාළ දේපළ පිහිටා ඇත.

2019ක් වූ පෙබරවාරි මස 25 වැනි දින ප.ව. 4.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2018.11.16 දින රජයේ *ගැසට් පත්‍රය* ද 2018.11.28 දින ලක්බිම, ඩේලිමිරර් හා තිනක්කුරල් පුවත්පත් බලන්න.

ගෙවීමේ ක්‍රමය : මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,000.00,

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : ජ්‍යෙෂ්ඨ කළමනාකරු (අයකිරීම් අංශය), හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී., අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.
දුරකථන අංක : 011-2661835, 011-2661836, 011-2661826

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක : 081-2210595/ 071-8446374/071-4962449

02-122

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - එරාවූර් ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරාවූර් ගමේ එරාවූර් පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය එරාවූර් පත්තු ප්‍රාදේශීය සභා සීමාවන් තුළ මිරකර්නි ග්‍රාම නිලධාරී වසම තුළ මිරකර්නි ගමේ මිරකර්නි පාරේ පිහිටි ඉඩමට බලයලත් මානක ඒ. එම්. නජුවුඩීන් විසින් 2017.02.11 වැනි දින සාදන ලද අංක ඒ. එම්. එන් 17/ඊපි/7500 දරන පිඹුරේ නිරූපිත ලොට් 01 නමැති බෙදා වෙන් කළ ඉඩම් කෙටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාව ඇතුළු අනෙකුත් සියලු දේ. ඉඩමේ ප්‍රමාණය රූඩ්. 03, පර්චස් 20.60 සහ එහි සියලුම සවි කරන ලද නිශ්චල යන්ත්‍රෝපකරණ යන්ත්‍ර සූත්‍ර සහ මෙවලීම් ඇතුළු පහත විස්තර කර ඇති නිශ්චල දේපළ ද සමගින් වේ.

සියලුම සවිකරන ලද නිශ්චල යන්ත්‍රෝපකරණ, යන්ත්‍රසූත්‍ර සහ මෙවලම් ඇතුළු උපකරණ වේ.

| *ඒකකය* | *විස්තරය* | *වර්ගය හා මාදිලිය* | *ආරම්භක රට* |
|---|---|---|---|
| 01 | ෆෝ ටොන් කැපැසිටි ස්ටීම් බොයිලර් | ෂෙල්මැක්ස්-තර්මැක්ස් ලිමිටඩ් සිරියල් අංක 1B-300-2 | ඉන්දියාව |
| 01 | පැඩි ඩ්‍රයර් - 26000 kg | | ඉන්දියාව |
| 01 | බර්නර් විත් 3.OHP මෝටර්ස් | | ශ්‍රී ලංකාව |
| 01 | ප්‍රේෂර් පම්ප් විත් 5.OHP මෝටර්ස් | | ශ්‍රී ලංකාව |
| 02 | පැඩි කූලර් 2x220.000 | | ශ්‍රී ලංකාව |
| 01 | පැඩි බොයිලර් එළිවේටර් - 132 Ft | | ශ්‍රී ලංකාව |

| ඒකකය | විස්තරය | වර්ගය හා මාදිලිය | ආරම්භක රට |
|---|---|---|---|
| 06 | ෂ්ටීල් බොයිලර් ටැන්ක්ස් විත් 12 අවුට් ලට්ස් | | ශ්‍රී ලංකාව |
| 03 | ඩය්ට් සිලෝස් 10ft high 3x330,000 | | ශ්‍රී ලංකාව |
| 02 | පැඩි ක්ලිනර් විත් මෝටර්ස් 7.5OHP | | චීනය |
| 01 | පැඩි ක්ලිනර් සෙපරේටර් විත් 3. OHP | | ඉන්දියාව |
| 01 | රයිස් ඩ්‍රයර් විත් 5.OHP මෝටර්ස් | | ශ්‍රී ලංකාව |
| 01 | රයිස් ඩ්‍රයර් විත් 3.OHP මෝටර්ස් | | චීනය |
| 01 | රයිස් එළිවේටර් - 496 ft | | ශ්‍රී ලංකාව |
| 02 | පැනල් බොඩර්ස් 7x750,000 | | චීනය |
| 01 | CCD රයිස් කලර් සෝටර් 4R මැෂින් විත් ඔල් ඇක්සසරිස් | හේෆි තායි ඔප්ටෝ ඉලෙක්ට්‍රොනික් 65XM-252 | චීනය |
| 01 | පැඩි ස්ටෝනර් | DXCINTQSX120 | චීනය |
| 01 | සෙපරේටර් | DXCINMGCz 100x10 | චීනය |
| 01 | රයිස් ග්‍රේඩර්ග් | DXCINMMIP 80x3 | චීනය |
| 01 | පැඩි ක්ලීනර් | DXCINTQLz 100x2 | චීනය |
| 01 | පැඩි ස්ටෝනර් | DXCINTQSx100 | චීනය |
| 02 | රයිස් වයිට්නර් | DXCIN | චීනය |
| 02 | සිල්කි පොලිෂර් | DXCINMPGH 19x1 | චීනය |
| 01 | පැඩි ඩ්‍රයර් විත් කැපැසිටි ඔෆ් 30,000 kg | | |
| 01 | යුනිට් ඔෆ් කැෂු බොයිලින් ටැන්ක් | | |

මෙම දේපළ ඔරයිසා රයිස් එක්ස්පෝටර්ස් (ප්‍රයිවේට්) ලිමිටඩ් යන අය බන්ධනදායී වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම.-* එරාවූර් නගරයේ ඔරලෝසු කණුව හන්දියේ සිට පුන්නයිකුඩා පාරේ මීටර් 800ක් පමණ ගමන් ගෙන දකුණට හැරී මිරරකර්නි පාරට පිවිස මෙම පාර ඔස්සේ මීටර් 300ක් පමණ ගමන් ගත් පසු වම් දෙසින් පිහිටි අඩි 20ක් පළල පාරට පිවිස එම පාරේ මීටර් 75ක් පමණ ගිය පසු පාරට මායිම්ව දකුණු පසින් අදාළ දේපළ පිහිටා ඇත.

2019ක් වූ පෙබරවාරි මස 25 වැනි දින ප.ව. 3.45 එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2018.11.16 දින රජයේ ගැසට් පත්‍රය ද, 2018.11.28 දින ලක්බිම, ඩේලිමීරර් හා තිනක්කුරල් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය :* මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,000.00,

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : ජ්‍යෙෂ්ඨ කළමනාකරු (අයකිරීම් අංශය), හැටන් නැෂනල් බැංක් පී. එල්. සී., අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2661835, 011-2661836, 011-2661826.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක : 081-2210595/ 071-8446374/071-4962449.

02-123

---

## නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී.එල්.සී.

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පණතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ලියාපදිංචි කාර්යාලය තුළ, මහතොඩුවාව ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ, මහවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, නාත්තණ්ඩිය ප්‍රාදේශීය සභා සීමාව තුළ, පිටිගල් කෝරළේ, යටකලන් පත්තුව හි උතුරු තොඩුවාව නමැති ග්‍රාමයෙහි පිහිටි"තාගහවත්ත" නමැති ඉඩමට බලයලත් මානක ඒ. ඒ. විමලසේන මහතා විසින් මැන සාදන ලද 2011.07.26 දිනැති අංක 4746A දරන පිඹුරෙහි දැක්වෙන කැබලි අංක 01 ලෙස බෙදා වෙන් කරන ලද ඉඩම් කැබැල්ල.

ප්‍රමාණය රූඩ් තුනයි පර්චස් දාහතක් (අ.0, රූ.3, පර්.17) විශාල ඉඩම් කොටස මෙම දේපළ මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ K 183/14 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩම සහ පරිශ්‍රය මත පිහිටි සියලුම ගොඩනැගිලි, නිශ්චල යන්ත්‍ර, යන්ත්‍රෝපකරණ, උපකරණ, සවි කිරීම්, එකී ඉඩම් කැබැල්ලට දැනට හෝ මෙයින් පසුව කලින් කලට ඇති කරන හෝ ස්ථිර වශයෙන් සිදුකරන ඇමුණුම් සහ සේවා ද සමග වන අතර විදුලිය සැපයීමේ පද්ධති සහ උපකරණ, ජලය සැපයීමේ පද්ධති සහ උපකරණ, විදුලි සංදේශ උපකරණ සහ වායු සමීකරණ උපකරණ සමග ද වේ.

හලාවත ප්‍රසිද්ධ නොතාරිස් කච්චිකඩුගේ හේමමාලි දේවිකා ප්‍රනාන්දු (මහත්මිය) විසින් ලියා සහතික කරන ලද 2016.04.19 දාතම හා අංක 545 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කොට ඇපකොට ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම තොඩුවාව සිය ලියාපදිංචි කාර්යාලය පිහිටි 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි අංක PV 66161 යථා පරිදි සංස්ථාගත කරන ලද "ඕ. එල්. එස්. සී. ෆුඩ් ගෘප් ඔෆ් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ්" සහ කොච්චිකඩේ සිය ලියාපදිංචි කාර්යාලය පිහිටි 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි අංක 73308 දරන යථා පරිදි සංස්ථාගත කරන ලද "ඇරෝව් සී ෆුඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්" විසින් (ණයට ගැණුම්කරුවන්) විසින් පැහැර හැර ඇති හෙයින් ද, තව ද, ඕ. එල්. එස්. සී. ෆුඩ් ගෘප් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් ඉහත උපලේඛනයේ විස්තර කරන ලද දේපළ හා පරිශ්‍රය සඳහා සිය නිදහස් අයිතිවාසිකම්, හිමිකම් සහ බලපුළුවන්කාරකම් ඉහත කී අංක 545 දරන එකී උකස් බැඳුම්කරය යටතේ බැංකුවට උකස්කොට ඇති හෙයින්,

නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී. එල්. සී. විසින් මා හට පවරා ඇති බලය ප්‍රකාරව, ඉහත සඳහන් එකී දේපළ

2019ක් වූ පෙබරවාරි මස 22 වැනි දින පෙ. ව. 11.30ට අදාළ දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම* - මහවැව සිට තෝඩුවාව වටා ගමන් කරන **"Beach"** පාර ඔස්සේ කිලෝමීටර් 1.5ක් පමණ ඉදිරියට ගමන් කර එතැනින් ඇති ශාන්ත අන්තෝනි පාරට හැරී තවත් ඉදිරියට කිලෝමීටර්1ක් පමණ ගමන් කරන විට වම් අතට ඇති අඩි 12ක් පමණ පළල පාරට හැරී ඉදිරියට ගමන් කරන විට අදාළ දේපළ හමුවේ. මෙම මාර්ගය මෙම මාළු කර්මාන්තශාලාවට යාමට සාදා ඇති මාර්ගයකි.

*ගෙවීම් කළ යුතු ආකාරය .-* විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය :

1. ගැණුම් මිලෙන් සියයට දහයක් 10%
2. ඉතිරි සියයට අනූව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30 ක් ඇතුලත නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු ය.
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
4. පළාත් පාලන අය බදු සියයට එකයි (1%)
5. ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%
6. ලිපිකරුගේ හා සෝෂකගේ වේතන රු. 1,500.00
7. නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම් රු. 2,500.00

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිළධාරීන්ගෙන් විමසන්න - කළමණාකරු මධ්‍යගත (අයකිරීම් අංශය), නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී. එල්. සී., අංක 40, නවම් මාවත, කොළඹ 02.
දුරකතන අංක : 011-2448448

ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්
බලයලත් වෙනදේසිකරුවෝ, තක්සේරුකරුවෝ සහ උසාවි
කොමසාරිස්වරු - කොළඹ වාණිජ මහාධිකරණ සහ
දිසා අධිකරණය, බලයලත් වෙන්දේසිකරුවෝ රාජ්‍ය සහ වාණිජ බැංකු.

අංක 200, හල්ස්ඩ්‍රෝෆ් වීදිය, කොළඹ 12, දුරකතන 0773242954,0112445393.

02-132

---

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වෙනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ඩබ්ලිව්. ශ්‍රියාණි සහ ආර්. ආර්. ජී. කේ. බන්ඩාර.

ගිණුම් අංක : 0145 5000 1420.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වෙනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2018.04.26 වෙනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් පනස් දෙලක්ෂ තිස් දෙදහස් එකසිය හැට නමයයි ශත තිස් හතක (රු. 5,232,169.37) මුදලද, 2018 අප්‍රේල් 09 දින සිට අයවියයුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හතලිස් හතර ලක්ෂ තිස් නම දහස් හයසිය අනූ හතයි ශත දහසයක (රු. 4,439,697/16) at the rate of Average Weighted Prime Lending Rate + Two Centum (2%) per annum (floor rate of 10% per annum) බැගින් වූ පොළියද, දැන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම්ද, දරන්නටද සිදුවූ ගාස්තුද, වෙනත් තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2019.01.04 දින රජයේ ගැසට් පත්‍රයේ 2018.12.31 දින "දිවයින", සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2019.03.05 දින ප.ව. 2.00 ට පිහිටි ස්ථානයේදී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**ඉහත කී උපලේඛනය**

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ බුත්තල කෝරළේ බුත්තල ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාසය තුළ බුත්තල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ යුදගනව ග්‍රාම නිළධාරී කොට්ඨාසයේ පීලේවෙල ග්‍රාමයේ පිහිටි "පීලේවෙලහේන" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී.බී.ඉලංගසිංහ යන අය විසින් සාදන ලද 2004 නොවැම්බර් 03 දාතම හා අංක. MO/410 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 01 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : එස්. ජී. පියදාස යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම - FVP 678 හි ලොට් 224 නැගෙනහිරට : FVP 678 හි ලොට් 187 දකුණට : බී. ඒ. එම්. මංගලිකා යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම - FVP 678 හි ලොට් 226 සහ බස්නාහිරට : FVP 678 හි ලොට් 223 - පාර සඳහා වෙන්කිරීම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් තුනක් (A:0 R:1 P:3) හෝ හෙක්ටයාර 0.1090 ක් විශාල ඉඩම් කොටස සමඟ පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමඟ එකී අංක. MO/410 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව LDO/ J06/ 40 යටතේ මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී ලොට් 1 නව මිනුමකට අනුව පහතින් විස්තර කොට ඇත :

එකී පීලේවෙල ග්‍රාමයේ පිහිටි " පීලේවෙලහේන" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. බී. ඉලංගසිංහ යන අය විසින් සාදන ලද 2014 මැයි 22 දාතම හා අංක. 1680 දරණ පිඹුර නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 01 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : එස්. ජී. පියදාස යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම - FVP 678 හි ලොට් 224 නැගෙනහිරට : FVP 678 හි ලොට් 187 දකුණට : බී. ඒ. එම්. මංගලිකා යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම - FVP 678 හි ලොට් 226 සහ බස්නාහිරට : FVP 678 හි ලොට් 223 - පාර සඳහා වෙන්කිරීම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් තුනක් (A:0 R:1 P:3) හෝ හෙක්ටයාර 0.1090 ක් විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග එකී අංක. 1680 දරණ පිඹුරට අනුවය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි
සමාගම් ලේකම්.

02-138

---

**ලංකා බැංකුව**

**1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම**

1. ණය යොමු අංක : 80846326 සහ 80872891.

හලාවත, මැයික්කුලම, නූර්ඩීන් වත්ත (ජයවත්ත) හි පදිංචි වර්ණකුලසූරිය ජූඩ් ප්‍රනාන්දු මහතාට සහ වර්ණකුලසූරිය ෂෙරින් ක්‍රිෂ්මලිකා පෙරේරා මියට අයත් උකස් කරන ලද දේපළ විකිණීම.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2019.01.04 දිනැති අංක 2105 දරන *ගැසට් පත්‍රයේ* හා 2018.12.21 වැනි දින ''දිනමිණ'', ''ඩේලිනිව්ස්'' හා ''තිනකරන්'' යන පුවත්පත් වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද, අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනවල පළමු සහ දෙවන විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේ දී ම 2019.02.21 වැනි දින පෙ. ව. 11.00 ට කොලොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

**පළමු උපලේඛනය**

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, උතුරු පිටිගල් කෝරළේ, මුන්නේස්වරම් පත්තුවේ, හලාවත ප්‍රාදේශීය සභා සීමාවේ හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 566B දරන මැයික්කුලම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මැයික්කුලම ග්‍රාමයේ පිහිටි "පරංගි තෝට්ටම් හෙවත් ජය එස්ටේට්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ශ්‍රීදරන් විසින් මැන සාදන ලද 2016.01.04 දිනැති අංක 6470 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල වූ එනම් එකී ලොට් 1ට උතුරට : බලයලත් මිනින්දෝරු ඩබ්. එස්. එස්. පෙරේරා විසින් සාදන ලද අංක 3136 දරන පිඹුරෙහි ලොට් 13 (අඩි 15ක් පළල ප්‍රාදේශීය සභා පාර) සහ ලොට් 17 ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු ඩබ්. එස්. එස්. පෙරේරා විසින් සාදන ලද අංක 3136 දරන පිඹුරෙහි ලොට් 17, 22 හා 21 ද, දකුණට : බලයලත් මිනින්දෝරු ඩබ්. එස්. එස්. පෙරේරා විසින් සාදන ලද අංක 3136 දරන පිඹුරෙහි ලොට් 20 (අඩි 20ක් පළල ප්‍රාදේශීය සභා පාර) සහ ලොට් 21 ද, බස්නාහිරට : බලයලත් මිනින්දෝරු ඩබ්. එස්. එස්. පෙරේරා විසින් සාදන ලද අංක 3136 දරන පිඹුරෙහි ලොට් 20 සහ 13 (අඩි 20ක් පළල) සහ අඩි 15ක පළල ප්‍රාදේශීය සභා පාර) ද, මායිම්ව පර්චස් තිස්දෙකක (අ.0, රූ.0, පර්.32) බිම් ප්‍රමාණය සහ එහි ඇති ගහකොළ, වගාවන්, ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේ ද වේ. මෙය හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A82/34 හි ලියාපදිංචි කර ඉදිරයට A82/103ට ගෙන ගොස් ඇත.

**දෙවන උපලේඛනය**

1. වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, උතුරු පිටිගල් කෝරළේ, මුන්නේස්වරම් පත්තුවේ, හලාවත ප්‍රාදේශීය සභා සීමාවේ හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 566B දරන මැයික්කුලම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මැයික්කුලම ග්‍රාමයේ පිහිටි "පරංගි තෝට්ටම් හෙවත් ජය එස්ටේට්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. එස්. එස්. පෙරේරා මහතා විසින් මැන සාදන ලද 1996.02.27 දිනැති අංක 3136 දරන පිඹුරෙහි ලොට් 5 (පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල වූ එනම් එකී ලොට් 5ට, උතුරු - නැගෙනහිරට : ලොට් 6 ද, නැගෙනහිරට : ලොට් 7 හා 8 ද, දකුණට : ලොට් 20 (අඩි 20ක් පළල පාරට වෙන් කළ කොටස) ද, බස්නාහිරට : ලොට් 6 ද, මායිම්ව එකී පිඹුර ප්‍රකාර පර්චස් අටයි දශම හතරයි බිංදුවක (අ.0, රූ.0, පර්.8.40) විශාල බිම් ප්‍රමාණය වේ. මෙය හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 145/124 හි ලියාපදිංචි කර ඉදිරියට A77/79 වෙත ගෙන ගොස් ඇත.

2. වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, උතුරු පිටිගල් කෝරළේ, මුන්නේස්වරම් පත්තුවේ, හලාවත ප්‍රාදේශීය සභා සීමාවේ හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 566B දරන මැයික්කුලම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මැයික්කුලම ග්‍රාමයේ පිහිටි "පරංගි තෝට්ටම් හෙවත් ජය එස්ටේට්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. එස්. එස්. පෙරේරා විසින් මැන සාදන ලද 1996.02.27 දිනැති අංක 3136 දරන පිඹුරෙහි ලොට් 13 (පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් ඉඩම් කැබැල්ල වූ එනම් එකී ලොට් 13 ට, උතුරට : ලොට් 14 ද, නැගෙනහිරට : ලොට් 15, 16, 17 සහ 18 ද, දකුණට : ලොට් 20 (අඩි 20ක් පළල පාරට වෙන් කළ කොටස ද), බස්නාහිරට : ලොට්

9, 10, 11 සහ 12 (එහෙත් ලොට් 7, 10, 11 හා 12 ලෙස ලියාපදිංචි වී ඇති) ද මායිම් එකී පිඹුර ප්‍රකාරව පර්චස් පහළොවයි දශම තුනයි බිංදුවක (අ.0, රූ.0, පර්.15.30) විශාල බිම් ප්‍රමාණය වේ. මෙය හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 145/125 හි ලියාපදිංචි කර ඉදිරියට A77/80 වෙත ගෙන ගොස් ඇත.

3. වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, උතුරු පිටිගල් කෝරළේ, මුන්නේස්වරම් පත්තුවේ, හලාවත ප්‍රාදේශීය සභා සීමාවේ හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 566B දරන මැයික්කුලම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මැයික්කුලම ග්‍රාමයේ පිහිටි "පරංගි තෝට්ටම් හෙවත් ජය එස්ටේට්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. එස්. එස්. පෙරේරා මහතා (එහෙත් බලයලත් මිනින්දෝරු) ඒ. ජී. පෙරේරා ලෙස (ලියාපදිංචි) විසින් මැන සාදන ලද 1996.02.27 (එහෙත් 1996 ලෙස ලියාපදිංචි) දිනැති අංක 3136 දරන පිඹුරෙහි ලොට් 20 (පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල වූ එනම් එකී ලොට් 20ට, උතුරට : ලොට් 2, 3, 5, 8, 9, 13, 18, 19, 21, 23, 25, 26 හා 28 ද, නැගෙනහිරට පාර (ප්‍රාදේශීය සභා) ද, දකුණට : ලොට් 29 සිට 37 සහ එම ඉඩමේ ඉතිරි කොටස ද, බස්නාහිරට : ලොට් 1 ද මායිම්ව එකී පිඹුර ප්‍රකාර රූඩ් එකයි පර්චස් හයයි දශම අටයි බිංදුවක (අ.0, රූ,1, පර්.06.80) විශාල බිම් ප්‍රමාණය වේ. මෙය හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 145/126 හි ලියාපදිංචි කර ඉදිරියට A77/77 වෙත ගෙන ගොස් ඇත.

4. වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, උතුරු පිටිගල් කෝරළේ, මුන්නේස්වරම් පත්තුවේ, හලාවත ප්‍රාදේශීය සභා සීමාවේ හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 566B දරන මැයික්කුලම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මැයික්කුලම ග්‍රාමයේ පිහිටි "පරංගි තෝට්ටම් හෙවත් ජය එස්ටේට්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. එස්. එස්. පෙරේරා මහතා (එහෙත් බලයලත් මිනින්දෝරු ඒ. සී. පෙරේරා ලෙස ලියාපදිංචි) විසින් මැන සාදන ලද 1996.02.27 දිනැති අංක 3136 දරන පිඹුරෙහි ලොට් 23 (පරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල වූ එනම් එකී ලොට් 23 ට, උතුරට : ලොට් 22 ද, නැගෙනහිරට : ලොට් 24 හා 25 ද, දකුණට : ලොට් 20 (අඩි 20ක් පළල පාරට වෙන් කළ කොටස ද), බස්නාහිරට : ලොට් 21 හා 22 ද මායිම්ව එකී පිඹුර අනුව පර්චස් තුනයි දශම බිංදුවක (අ.0, රූ,0, පර්.3.0) විශාල බිම් ප්‍රමාණය වේ. මෙය හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 145/127 හි ලියාපදිංචි කර ඉදිරියට A77/78 වෙත ගෙන ගොස් ඇත.

5. වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, උතුරු පිටිගල් කෝරළේ, මුන්නේස්වරම් පත්තුවේ, හලාවත ප්‍රාදේශීය සභා සීමාවේ හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 566B දරන මැයික්කුලම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මැයික්කුලම ග්‍රාමයේ පිහිටි "පරංගි තෝට්ටම් හෙවත් ජය එස්ටේට්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු වර්නන් පෙරේරා මහතා විසින් මැන සාදන ලද 1978.03.25 දිනැති අංක 4538A දරන පිඹුරෙහි ලොට් 9 (පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල වූ නම් එකී ලොට් 9 ට, උතුරට : ලොට් 7 හා 8 ද, නැගෙනහිරට : හලාවත කොළඹ ප්‍රධාන පාර ද, දකුණට : ලොට් 10, 11 සහ 12 ද, බස්නාහිරට : දුම්රිය මාර්ගය හා රක්ෂිතය ද මායිම්ව එකී පිඹුර ප්‍රකාර රූඩ් එකක (අ.0, රූ.1, පර්.0) විශාල බිම් ප්‍රමාණය වේ. මෙය හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 145/128 හි ලියාපදිංචි කර ඉදිරියට A62/102 වෙත ගෙන ගොස් ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩබ්. ජේ. ඩබ්. ප්‍රනාන්දු මහතා,
කළමනාකරු.

ලංකා බැංකුව,
මහවැව.

02-147

---

## ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය යොමු අංකය - 72186485.

පානදුර, මිනුවම්පිටිය පැරකුම් මාවත අංක 2සී/1 හි පදිංචි ඩී. එස්. ජයතුංග මහතා සහ ජේ. ඩී. එස්. ජයතුංග මහත්මියට අයත් උකස් කරන ලද දේපළ විකිණීම.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2015.07.24 දිනැති අංක 1925 දරන ගැසට් පත්‍රයේ හා 2015 ජූලි 10 වෙනි සිකුරාදා දින "ඩේලිනිව්ස්", "දිනමිණ" හා "තිනකුරන්" යන පුවත්පත්වල පළකරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියක අනුකූලව මුල් ණය මුදලේ ශේෂයද , විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ලංකා බැංකුව ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අය කර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල සහ පරිශ්‍ර එකී ස්ථානයේදීම 2019.02.25 වෙනි දින පෙ.ව. 10.30 ට කොළොන්නාව විහාර මාවතේ අංක 50/3 හි පදිංචි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

### ඉහත සඳහන් පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, කලුතර දිස්ත්‍රික්කයේ, පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, පානදුර ප්‍රාදේශී සභා සීමාවේ අංක 679B දරන වලාන දකුණ ග්‍රාමසේවා නිලධාරී කොට්ඨාසයේ පානදුර තොටමුනේ, පානදුර තල්පිටි දෙබැද්දේ පානදුර මිනුවන්පිටිය පිහිටි "උල්දියවලකඩ" නැමති ඉඩමට එහි ඇති ගොඩනැගිලි, ගහකොළ සහ වෙනත් සියලු දේ සහිතව බලයලත් මිනින්දෝරු ඩී. ජේ. පී. මාගොඩරත්න විසින් සාදන ලද 1947 නොවැම්බර් 09 දිනැති අංක 46 දරන පිඹුරෙහි ලොට් 2 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 2 උතුරට අංක 46 දරන පිඹුරෙහි ලොට් ඒ ද නැගෙනහිරට උල්දියවලකඩ ඕවිට ද දකුණට අංක 477 දරන පිඹුරෙහි ලොට් 1 හා 3 (පාරට වෙන් කළ කොටස) ද, බස්නාහිරට අංක 46 දරන පිඹුරෙහි ලොට් D ද මායිම්ව එකී අංක 46 දරන පිඹුර ප්‍රකාර පර්චස් විසිතුනයි දශම පහක (අ.0 රූ.0 පර්. 23.5) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 526/139 හි ලියාපදිංචි කර ඇත.

බලයලත් මිනින්දෝරු ජී. අබේපිටිය විසින් මෑතකදී මැන සාදන ලද 1992 මාර්ත 20 දිනැති අංක 2571 දරන පිඹුරට අනුව එහි ඉඩම පහත ආකාරයට විසිතර කොට ඇත.

එකී මිනුවන්පිටියෙහි පිහිටි "උල්දියවලකඩ" නැවති ඉඩමට එහි ඇති ගොඩනැගිලි, ගහකොළ සහ වෙනත් සියලු දේ ඇතුළත් වූ එකී අංක 2571 දරන පිඹුරෙහි ලොට් 2 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 2 උතුරට උල්දියවලකඩ හෙවත් කහටගහවත්තෙහි ලොට් A ද නැගෙනහිරට උල්දියවලකඩ ද දකුණට බලයලත් මිනින්දෝරු වයි. කරුණාසේන කොස්තා විසින් සාදන ලද 1986 ජනවාරි 16 දිනැති අංක 447 දරන පිඹුරෙහි නිරූපිත කහටගස්වත්ත හෙවත් උල්දියවලකඩ හි ලොට් 1 සහ 3 ද බස්නාහිර කහටගහවත්ත හෙවත් උල්දියකඩවල හි ලොට් D ද මායිම්ව අංක 2571 දරන පිඹුර ප්‍රකාර පර්චස් විසිතුනයි දශම පහක (අ.0 රූ.0 පර්. 23.5) බිම් ප්‍රමාණයකින් සමන්විත වේ.

### ඉහත සඳහන් දෙවන උපලේඛනය

එකී මිනුවන්පිටියෙහි පිහිටි "උල්දියවලකඩ" නැමති ඉඩමෙහි අංක 46 දරන පිඹුරෙහි ලොට් 46 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 46 උතුරට කොස්ගහවත්තද නැගෙනහිරට අංක 46 දරන පිඹුරෙහි ලොට් A හා C ද දකුණට තන්තිරිමුල්ල දක්වා වූ පාරද බස්නාහිරට අංක 46 දරන පිඹුරෙහි ලොට් B ද මායිම්ව එකී අංක 46 දරන පිඹුර ප්‍රකාර පර්චස් නවයක (අ.0 රූ. 0 පර්. 9) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය පානදුර ඉඩමේ ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 283/17 හි ලියාපදිංචි කර ඇත.

එකී මිනුවන්පිටියෙහි පිහිටි "උල්දියවලකඩ" නැවති ඉඩමෙහි එකී අංක 477 දරන පිඹුරෙහි ලොට් 3 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 3 උතුරට පිඹුරු අංක 477 හි ලොට් 2 ද නැගෙනහිරට පිඹුරු අංක 477 හි ලොට් 1 ද දකුණට තන්තිරිමුල්ල දක්වා වූ පාරද, බස්නාහිරට පිඹුරු අංක 46 හි ලොට් D (පාරට වෙන් කළ කොටස) ද මායිම්ව එකී අංක 477 දරන පිඹුර ප්‍රකාර පර්චස් එකයි දශම තුනක (අ.0 රූ.0 පර්. 1.3) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 283/173 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

අයි. පී. කේ. එන්. පෙරේරා මහත්මිය,

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිණී.

ලංකා බැංකුව,

පානදුර අධිශ්‍රේණි ශාඛාව.

02 - 148

---

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - දෙනියාය ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 04 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී දෙනියාය ශාඛාව (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. සී. ආර්. ඩී. රාජපක්ෂ විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී නමට ලියන ලද්දා වූ ද 2017 අගෝස්තු මස 31 වැනි දින සහතික කළ අංක 4203 දරන බැඳුම්කරය යටතේ අය වියයුතු මුදල් ගෙවීම නාලනී මල්කාන්ති අලහකෝන්, නදීජ නිරෝෂන වික්‍රමරත්න සහ පූජිත තමල් අලහකෝන් වික්‍රමරත්න හෙවත් පූජිත තුමල් අලහකෝන් වික්‍රමරත්න යන අය ණයකරුවන් ලෙස පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුලුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2019ක්වූ පෙබරවාරි මස 27 වැනි දින පෙ.ව. 10.30ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛණය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරළේ, පිටබැද්දර ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 206ජී වැලිව ග්‍රාම නිලධාරී වසමේ වැලිව ගමෙහි පිහිටි පිල්ලහේන සහ පොල්ගස්විලහේන්යාය ලෙස හැඳින්වෙන හෙමගිර එස්ටේට් ලෙස හැඳින්වෙන ඉඩමට බලයලත් මිනින්දෝරු

ඒ. ජේ. ජයසේකර විසින් 2012 දෙසැම්බර් මස 23 වැනි දින මැන සාදන ලද අංක 260/2012 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් ඒ දරන ඉඩම් කොටස ප්‍රමාණයෙන් අක්කර දහසයයි රූඩ් තුනයි පර්චස් විසිදෙකයි දශම හයයි අටක (අ.16, රූ.3, පර්.22.68) විශාලත්වයෙන් යුතු වූ ඉඩම සමග ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලුම දේත් සමග වේ.

බලයලත් මිනින්දෝරු ඒ. ජේ. ජයසේකර විසින් 2012.12.28 වැනි දින පිළියෙල කරන ලද අංක 260/2012 දරන පිඹුරේ ලොට් අංක බී, සී, ඩී, ඊ, එෆ්, ජී, එච් සහ ජේ යන පාර සඳහා වෙන් කරන ලද මාර්ග අයිතිය සමඟ වේ.

*යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා* 2018.11.16 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* හා 2018.11.26 වැනි දින මව්බිම, තිනකුරල් සහ ඩේලිමිරර් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* - මොරවක දෙනියාය පාරේ කි. මී. 1/2ක් පමණ ගමන් කරන්න. නෙළුව දෙසට දිවෙන රළු මාවතක් වම් අත පැත්තේ ඇත. එම පාරේ මීටර් 100ක් ගිය තැන අදාළ ඉඩම පාරේ දකුණු අත පැත්තේ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

01. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
02. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%) ක් ද.
03. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු,
04. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු.2,000) ද,
05. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් දහසක් (රු.1,000) ක් ද,
06. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු : (ණය අධීක්ෂණය සහ අය කිරීම) හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී., අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10. (දුරකථන අංක 2661866, 2661828 ගෙන් ලබා ගත හැක.)

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා බලයලත් වෙන්දේසිකරු.

අංක 56 - මඩිහේ නාහිමි මාවත,
මහරගම.
දුරකථන අංක - 0777-378441/ 0714-424478
ෆැක්ස් - 0112-509442

02-156

**සෙලාන් බැංකුව පී.එල්.සී. - අක්කරෙයිපත්තු ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මෙම දේපළ අක්කරෙයිපත්තු පදිංචි මොහමඩ් ඉස්මයිල් මරිස් යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැංකුව පී එල් සී වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුව වෙත සුරක්ෂිත කර ඇත.

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, අක්කරෙයිපත්තු අලයාඩිගෙම්බු ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ 09 කරුන්කෝඩිතිවු ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාසයේ 09 කරුන්කෝඩිතිවු පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. ඒ. මොහමඩ් ටස්ලීම් විසින් සාදන ලද 2014.02.12 දිනැති අංක ටී/1890 මිනුම් සැලැස්ම අනුව රූඩ් දෙකයි පර්චස් එකොළහයි දශම හතක් (අ. 0, රූ. 02, පර්. 11.7)ක් විශාල මොහයිදීන් සාතුක්කම් නමැති ඉඩමේ ලොට් අංක 1 සහ ලොට් අංක 2 ලකුණු කළ සියලු දේ සමඟ ඉඩම.

මෙය බලයලත් මිනින්දෝරු ඒ. ඒ. මොහමඩ් තස්ලීම් විසින් සාදන ලද 2016.03.21 දිනැති අංක ටී/2253 දරන මෑතක මිනුම් සැලැස්මක් අනුව පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ අක්කරෙයිපත්තු, අලයාඩිගෙම්බු ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ 09 අක්කරෙයිපත්තු ග්‍රාමසේවා නිලධාරී කොට්ඨාසයේ 09 අක්කරෙයිපත්තු මොහයිදීන් චතුරස්‍රයේ පිහිටි අංක ටී/1890 සැලැස්මෙහි කැබලි අංක 1 සහ 2 හි නැවත මැනීමක් වන රූඩ් දෙකයි පර්චස් එකොළහයි දශම හතක් (අ.0 රූ.2 පර්. 11.7) ක් නොහොත් හෙක්ටයාර් 0.2320 ක් විශාල කැබලි ඒ සහ බී ලෙස ලකුණු කළ ඉඩම් කොටස් දෙක.

ඉහත සඳහන් දේපළ 2019 පෙබරවාරි මස 20 වැනි දින පෙ. ව. 10.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - අක්කරෙයිපත්තු ඔරලෝසු කණුව මංසන්ධියේ සිට පොතුවිල් පාර ඔස්සේ කි.මී. 1.35 ක පමණ දුරක් ගිය විට " කුස්ටියා හාල් මෝල" නමැති අදාළ දේපළ මාර්ගයේ දකුණුපසින් පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.* - රජයේ *ගැසට් පත්‍රයේ* 2018.01.19 වන දින පළවී ඇති අතර, ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2018.01.26 වන දින ද තිනකුරල් පුවත්පතේ 2018.01.17 වන දින පළවී ඇත.

ගෙවීමේ ක්‍රමය.- සාර්ථක ගැනුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මුදලේ 10% (සියයට දහය), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්), වන පළාත අධිකාරි බද්ද සහජ් වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් ගෙවනු ලබන වෙනත් ඕනෑම බද්දක් 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්) 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000/-, 5. ලිපිකරු හා සෝෂකගේ වේතන රු. 1000/- ද. 6. සියළුම ප්‍රචාරක වියදම්, 7. ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකරීම් වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතුයි.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30 ක් ඇතුළත නොගෙවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : නීති ප්‍රධානී, සෙලාන් බැංකුව පී එල් සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දු. ක. 011 2456465, 2456479.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව,
දුරකථන අංක. 0113068185, 0112572940

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු සහ උසාවි කොමසාරිස්.

02 - 158

---

### ලංකා බැංකුව

**1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම**

1) ජංගම ගිණුම් අංකය : 8789967.

මල්වාන, වල්ගම, අංක 358/1 හි අලුත් වීදිය කෝරාලලාගේ අජිත් උපනන්ද කෝරලේ මහතාට අයත් උකස් කරන ලද දේපළ විකිණීම.

2) ලංකා බැංකු ආඥපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2018.03.09 දිනැති අංක 2062 දරන ගැසට් පත්‍රයේ හා 2018.03.05 වැනි දින "ඩේලිනිව්ස්", "දිනමිණ" හා "තිනකරන්" යන පුවත්පත්වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අය විය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේ දී ම 2019.03.07 වැනි දින පෙ. ව. 11.30 ට කොළොන්නාව, විහාර මාවතේ අංක 50/3 හි පදිංචි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය සභා සීමාවේ සහ බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 281 දරන නැගෙනහිර වල්ගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වල්ගම පිහිටි "පැලැන්ගහවත්ත" නැමති ඉඩමේ බලයලත් මිනින්දෝරු එච්. එච්. කේ. සී. ජයලත් විසින් සාදන ලද 2002 පෙබරවාරි මස 09 දිනැති අංක 401 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1, උතුරට : :කලුපතිරුන්නැහැලාගේ සීලවතී උරුමකම් කියන තුන් හවුල් පැලැන්ගහවත්ත ද, නැගෙනහිරට : එම්. ඉසෙඩ් අහමඩ් අෂ්රොෆ් උරුමකම් කියන පැලැන්ගහවත්ත සහ එච්. පී. සුනිල් හේවාවසම් උරුමකම් කියන පැලැන්ගහවත්ත සහ ඊ. ඩබ්. සමරසේකර උරුමකම් කියන තුන්හවුල් පැලැන්ගහවත්ත ද, දකුණට :ඊ. ඩබ්. සමරසේකර උරුමකම් කියන තුන්හවුල් පැලැන්ගහවත්ත සහ බලයලත් මිනින්දෝරු එච්. එච්. කේ. සී. ජයලත් විසින් සාදන ලද අංක 400 දරන පිඹුරෙහි ලොට් 1 සහ ඒ. එම්. විමලදාස උරුමකම් කියන තුන්හවුල් පැලැන්ගහවත්ත ද, බස්නාහිරට : පාර ද මායිම්ව එකී අංක 401 දරන පිඹුරට අනුව අක්කර එකයි, රූඩ් එකයි පර්චස් බිංදුවයි දශම එකයි අටක (අ. 1, රූ. 1, පර්. 0.18) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගහකොළ, වගාවන්, ගොඩනැගිලි හා වෙනත් සියලු දේ ද වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ 238/100හි ලියාපදිංචි කර ඇත.

ලොට් 1 ලෙස දක්වා ඇති එකී ඉඩම් කැබැල්ල පහත දක්වා ඇති ඉඩමේ කොටසක් දැනට පවත්නා මායිම්වල නැවත මැනීමකි. එනම්,

එකී වල්ගම ග්‍රාමයේ පිහිටි "පැලැන්ගහවත්ත" නැමති ඉඩමේ සීමා විස්තර කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : විතානගේ නිකුලස් අප්පුගේ ඉඩම මෙම ඉඩමේ තවත් කොටසක් ද, නැගෙනහිරට :මෙම ඉඩමේ තවත් කොටසක් ද, දකුණට : මෙම ඉඩමේ තවත් කොටසක් ද, බස්නාහිරට : අමා ලෙබ්බේ මරික්කාර්ගේ ඉඩමද මායිම්ව අක්කර එකයි, රූඩ් දෙකයි, පර්චස් තිහක (අ. 1, රූ.

1, පර්. 30) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 761/83 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩී. ලියනගුණවර්ධන,
කළමනාකරු.

ලංකා බැංකුව,
බොරැල්ල 2 වන ශාඛාව.

02-161

---

**ලංකා බැංකුව**

1968 අංක. 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

1) ජංගම ගිණුම් අංකය : 8789967 ණය අංකය : 74943512.

මල්වාන, වල්ගම, අංක 358/1 හි අලුත් වීදිය කෝරාලලාගේ අජිත් උපනන්ද කෝරලේ මහතාට අයත් උකස් කරන ලද දේපල විකිණීම.

2) ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2018.03.09 දිනැති අංක 2062 දරන ගැසට් පත්‍රයේ හා 2018.03.06 දින ''ඩේලිනිව්ස්'', ''දිනමිණ'' හා ''තිනකරන්'', යන පුවත්පත්වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අය කර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල සහ පරිශ්‍ර එකී ස්ථානයේදීම 2019.03.07 වැනි දින පෙ.ව. 11.00 ට, කොළොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි පදිංචි ටී ඇන්ඩ් එච් ඔක්ෂන් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය සභා සීමාවේ සහ බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 281 දරන නැගෙනහිර වල්ගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ වල්ගම පිහිටි ''තුන්හවුල් පැලැන්ගහවත්ත'' නැමති ඉඩමේ බලයලත් මිනින්දෝරු එම්. එස්. පෙරේරා විසින් සාදන ලද 1959.10.12 දිනැති අංක 1108-P දරන පිඹුරෙහි ලොට් 6 ලෙස දක්වා සීමා විස්තර කොට ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 6 උතුරට : තුන්හවුල් පැලැන්ගහවත්තෙන් කොටසක් ද, නැගෙනහිරට : ලොට් 7 ද, දකුණට : P.W. D පාර සහ ලොට් 05 ද, බස්නාහිරට : ලොට් 05 සහ 04 ද මායිම්ව එකී අංක 1108-P දරන පිඹුරට අනුව රූඩ් දෙකයි පර්චස් නවයක (අ.0 රූ.2 පර්.9) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති හා වැඩෙන ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ ද වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ N74/34 ලියාපදිංචි කර ඇත.

මෑතකදී කරන ලද මැනීමකට අනුව ඉහත ඉඩම පහත ආකාරයට විස්තර කොට ඇත.

එකී වල්ගම පිහිටි ''තුන්හවුල් පැලැන්ගහවත්ත'' නැමති ඉඩමට බලයලත් මින්න්දෝරු එච්. එච්. කේ. සී. ජයලත් විසින් සාදන ලද 2002.02.09 දිනැති අංක 400 දරන පිඹුරෙහි (ඔප්පුවට අනුව බලයලත් මිනින්දෝරු එච්. එච්. කේ. සී. ජයලත් විසින් සාදන ලද 2002.02.09 දිනැති අංක 400 දරන පිඹුරෙහි නිරූපිත ඉඩම) ලොට් 1 ලෙස දක්වා සීමා විස්තර කොටස නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම්, එකී ලොට් 1 උතුරට : තුන්හවුල් පැලැන්ගහවත්තෙන් කොටසක් ද, නැගෙනහිරට : අයි. ඩබ්. සමරසේකර උරුමකම් කියන තුන්හවුල් පැලැන්ගහවත්ත (අංක 1108-P දරන පිඹුරෙහි ලොට් 7) ද, දකුණට : අයි. ඩබ්. සමරසේකර උරුමකම් කියන තුන්හවුල් පැලැන්ගහවත්ත ද (අංක 1108- P දරන පිඹුරෙහි ලොට් 7) සහ පාරද, බස්නාහිරට : පාර සහ ඒ. එම්. විමලසේන උරුමකම් කියන පැලැන්ගහවත්ත ද මායිම්ව එකී අංක 400 දරන පිඹුරට අනුව රූඩ් දෙකයි පර්චස් බිංදුවයි දශම එකයි අටක (අ.0 රූ.2 පර්.0.18) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති සහ වැඩෙන ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ ද වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හි N74/34 ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩී. ලියනගුණවර්ධන.
කළමනාකරු.

ලංකා බැංකුව
බොරැල්ල 2 වන ශාඛාව,

02-163

---

**ලංකා බැංකුව - වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය යොමු අංක : 80616685.

දිගන, රජවැල්ල දකුණ, අංක 483/3 සහ පේරාදෙණිය, කළුගමුව, මෙගොඩ, නෙඩ්සා, අංක 28හි වික්‍රමසිංහ මුදියන්සේලාගේ සීතා

කුමාරි හෙවත් වික්‍රමසිංහ මහත්මියට අයත් උකස් කරන ලද දේපල විකිණීම.

ලංකා බැංකු ආඥාපනතේ 19 වෙනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2018 අගෝස්තු 24 දිනැති අංක 2086 දරන ගැසට් පත්‍රයේ හා 2018 අගෝස්තු 21 වන අඟහරුවාදා දින ''ඬේලිනිවුස්'' ''දිනමිණ'' හා ''තිනකරන්'' යන පුවත්පත්වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂයද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළියද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අය කර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපල සහ පරිශ්‍ර එකී ස්ථානයේ දී ම 2019 මාර්තු 13 වන බදාදා දින පෙ. ව. 11.00ට, මහනුවර, ටොරින්ටන් පාර, අංක 24හි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ගඟ පළාතේ, යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාවේ ගඟ පළාත පැලෑව ඉහළ මැද ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පැලෑව ග්‍රාමයේ පිහිටි ''මැදගම්මැද්ද ගෙදර හිටින ගෙදර වත්ත''නමැති ඉඩමට එහි ඇති පස, ගහකොළ වගාවන් සහ සියලු දේ ඇතුළත්ව බලයලත් මිනින්දෝරු ඩී. ඒ. එම්. සී. දිසානායක විසින් සාදන ලද 2016 මැයි 05 දිනැති අංක 2838 දිනැති පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා ඇත. බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1 උතුරට : ජී. ජී. පියසේන උරුමකම් කියන ගල්අංගේ ගෙදර වත්ත ද, නැගෙනහිරටඃ නිවසේ සිට විජිත මාවත දක්වා පාර (PRS) ද, දකුණට : පී. එම්. ජී. සිරිපාලගේ උරුමකරුවන් අයිතිවාසිකම් කියන එම ඉඩමේ කොටසක්ද, බස්නාහිරට : පී. එම්. ජී. විමලසේන උරුමකම් කියන එම ඉඩමේ කොටසක් (බලයලත් මිනින්දෝරු ඒ. බී. කිරිදෙන විසින් සාදන ලද අංක 3130 දරන පිඹුරේ ලොට් 2) ද මායිම්ව එකී අංක 2838 දරන පිඹුරට අනුව පර්චස් දාහතරයි දශම දෙකයි පහක (අ.0 රූ0 පර්. 14.25) බිම් ප්‍රමාණයකින් යුක්ත වේ.

එකී ලොට් 1 පහත විස්තර කර ඇති ඉඩමෙහි නැවත මැනීමකි.

එකී පැලෑව ග්‍රාමයේ පිහිටි ''මැදගම්මැද්ද ගෙදර හිටින ගෙදර වත්ත'' නමැති ඉඩමට එහි ඇති පස, ගහකොළ, වගාවන් සහ සියලු දේ ඇතුළත්ව බලයලත් මිනින්දෝරු ඒ. බී. කිරිදෙන විසින් සාදන ලද 1985 ජුනි 19 දිනැති අංක 3130 දරන පිඹුරෙහි ලොට් 02 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 2 උතුරට : ගල්අංගේ ගෙදර වත්තේ වැටද, නැගෙනහිරට : ගම්සභා පාර සහ වටගොඩ ගෙදර වත්ත නිවැරදිව ගම්සභා පාර සහ බටගොඩ ගෙදර වත්තද, දකුණට : එම ඉඩමේ ඉතිරි කොටස හා අගල ද, බස්නාහිරට : එකී පිඹුරෙහි ලොට් 1 තුම්පෙල වත්ත හා පැළ ඉණි වැටද මායිම්ව එකී අංක 3130 දරන පිඹුරට අනුව පර්චස් දහසයයි දශම බිංදුවයි පහක (අ. 0 රූ. 0 පර්. 16.05) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B562/139හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
ලංකා බැංකුව,
අධිශ්‍රේණි ශාඛාව,
මහනුවර.

එස්. කේ. ගජනායක,
ප්‍රධාන කළමනාකරු.

02-152

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල *රු. ශ.* | තැපැල් ගාස්තුව *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

**2019**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| **පෙබරවාරි** | 2019.02.01 | සිකුරාදා | 2019.01.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.02.08 | සිකුරාදා | 2019.01.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.02.15 | සිකුරාදා | 2019.02.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.02.22 | සිකුරාදා | 2019.02.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| **මාර්තු** | 2019.03.01 | සිකුරාදා | 2019.02.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.03.08 | සිකුරාදා | 2019.02.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.03.15 | සිකුරාදා | 2019.03.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.03.22 | සිකුරාදා | 2019.03.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.03.29 | සිකුරාදා | 2019.03.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අප්‍රේල්** | 2019.04.05 | සිකුරාදා | 2019.03.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.04.12 | සිකුරාදා | 2019.03.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.04.18 | බ්‍රහස්පතින්දා | 2019.04.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2019.04.26 | සිකුරාදා | 2019.04.12 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ - 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.